# පූජාපිටිය ප්‍රාදේශීය සභාව.
## මහනුවර දිස්ත්‍රික්කය

## 1. මූල්‍ය ප්‍රකාශන.

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 30 දින ද, ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2014 මාර්තු 28 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2015 ජුලි 13 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

### 1.2 මතය.

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට පූජාපිටිය ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.

#### 1.3.1 ලැබියයුතු ගිණුම්.

2014 දෙසැම්බර් 31 දිනට ලැබියයුතු ගිණුම් ශේෂවල එකතු වටිනාකම රු.66,393,616 ක් වූ අතර, එයින් අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබූ ගිණුම් ශේෂයන් හී එකතුව රු.5,514,467 ක් වී තිබුණි.

#### 1.3.2 ගෙවියයුතු ගිණුම්.

2014 දෙසැම්බර් 31 දිනට එකතුව රු.63,124,976 ක් වූ ගෙවියයුතු ගිණුම් ශේෂවල වටිනාකමින් අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබූ ගිණුම් ශේෂයන් හී එකතුව රු.7,387,479 ක් වී තිබුණි.

#### 1.3.3 නීති, රීති හා රෙගුලාසී ආදියට අනුකූල නොවීම.

පහත සඳහන් නීති, රිති හා රෙගුලාසීවලට අනුකූල නොවූ අවස්ථා නිරික්ෂණය විය.

| නීති, රීති හා රෙගුලාසී යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| 2003 අප්‍රේල් 11 දිනැති අංක සීපීසී/සීඑල්/06/06/02 දරන මධ්‍යම පළාත් සභාවේ ප්‍රධාන ලේකම්ගේ චක්‍රලේඛය. | I. සභාවේ සේවය කරනු ලබන නිලධාරීන් හා සේවකයින් 11 දෙනෙකුගෙන් එකතුව රු.25,000 ක ඇප මුදලක් ලබා ගෙන නොතිබුණි. |
| | II. ගිණුම නිලධාරියා නමින් පවත්වා භාරකාරත්ත්වය ආයතන ප්‍රධානියා සතු වියයුතු වූ රු.26,250 ක් |

වටිනා ගිණුම් ශේෂ 11 ක වටිනාකම් 2014 දෙසැම්බර් 31 දින වන විටත් ආයතන ප්‍රධානියාගේ භාරකාරත්ත්වයට පත් කර නොතිබුණි.

**2. මූල්‍ය සමාලෝචනය.**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.5,162,253 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.6,846,061 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලය රු.1,683,808 ක පිරිහීමක් දක්නට ලැබුණි.

**2.2 ආදායම් පරිපාලනය.**

**2.2.1 ආදායම් රැස් කිරීමේ කාර්යය සාධනය**

**ඇස්තමේන්තුගත ආදායම් , තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්**

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | 2014.01.01 දිනට හිඟය | වර්ෂයේ බිල් කළ ආදායම | එකතු කළ ආදායම | | 2014.01.01 දිනට හිඟ හිටි ශේෂයෙන් අය නොවූ ප්‍රමාණය | 2014 බිල් කළ ආදායමෙන් අය නොවූ ප්‍රමාණය | මුළු අයකළ යුතු ප්‍රමාණය |
|---|---|---|---|---|---|---|---|
| | | | 2014.01.01 දිනට හිඟයෙන් එකතු කළ ආදායම | 2014 වර්ෂයේ බිල් කළ ආදායමෙන් එකතු කළ ආදායම | | | |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| **වරිපනම් හා බදු** | **1,705,176** | **2,918,230** | **626,186** | **1,622,908** | **1,078,990** | **1,295,322** | **2,374,312** |
| **බලපත්‍ර ගාස්තු** | **-** | **2,480,000** | **-** | **1,901,340** | **-** | **578,660** | **578,660** |
| **බදු කුලී (මස්,මාළු,කඩ)** | **312,575** | **997,700** | **278,000** | **789,375** | **34,575** | **208,325** | **242,900** |
| **වෙනත්** | **2,604,746** | **9,787,731** | **2,401,663** | **2,997,230** | **203,083** | **6,790,501** | **6,993,584** |
| **එකතුව** | **4,622,497** | **16,183,661** | **3,305,849** | **7,310,853** | **1,316,648** | **8,872,808** | **10,189,456** |

**සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟ ආදායම් රු.10,189,456 ක් විය.**

**2.2.2 වරිපනම් බදු**

සමාලෝචිත වර්ෂය ආරම්භයේ දි රු.1,705,176 ක ශේෂයක් පැවති අතර, වර්ෂයේ බිල් කිරීම් රු.2,918,230 ක් විය. වර්ෂයේ අය කිරීම් ප්‍රතිශතය සියයට 57 ක් පමණ වූයෙන්, 2014 දෙසැම්බර් 31 දිනට අය වියයුතු මුදල රු.2,374,312 ක් වී තිබුණි. එම ශේෂයෙන් වර්ෂ 01 ක කාලයක් ඉක්ම වු ශේෂවල වටිනාකම රු.1,078,990 ක් විය.

**2.2.3 බදු කුළී.**

(අ) පළාත් පාලන කොමසාරිස්ගේ 1980 දෙසැම්බර් 31 දිනැති අංක 1980/46 දරන චක්‍රලේඛයට අනුව, කටයුතු කරමින් තක්සේරු දෙපාර්තමේන්තුවේ කේඞී/ආර්පී/3536 හා 2015 මාර්තු 02 දිනැති ලිපිය මගින් අඹතැන්න වෙළඳ සංකීර්ණයේ කඩ කාමරවල බදු කුළී සංශෝධනය කර තිබුණි. නව තක්සේරු ප්‍රමාණයන් ක්‍රියාත්මක නොකිරීමට 2015 මාර්තු 12 දින රැස් වූ මහා සභාවේ දී තීරණය කර තිබුණෙන් මාසිකව රු.29,450 බැගින් රු.353,400 ක ආදායමක් සභාවට අහිමි වී තිබුණි.

(ආ) 2014 දෙසැම්බර් 31 දිනට රු.242,900 ක බදු කුළි හිග ශේෂයක් පැවති අතර, එම ශේෂයෙන් වර්ෂ 01 ක කාලයක් ඉක්මවා තිබු ශේෂය රු.34,575 ක් විය. මෙම හිඟ බදු මුදල් අයකර ගැනිමට විධිමත් වැඩපිළිවෙලක් අනුගමනය කර නොතිබුණි.

**2.2.4 උසාවි දඩ හා මුද්දර ගාස්තු.**

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරින්ගෙන් 2014 දෙසැම්බර් 31 දිනට උසාවි දඩ රු.400,000 ක් හා මුද්දර ගාස්තු රු.6,593,584 ක් ලැබියයුතුව පැවතුණි. එම ශේෂවලින් උසාවි දඩ රු.38,422 ක් හා මුද්දර ගාස්තු රු.3,000,000 ක් 2015 ජුනි 30 දින වන විට තවදුරටත් අය විය යුතුව තිබුණි.

**2.2.5 වෙනත් ආදායම්**

සමාලෝචිත වර්ෂය තුළ බැකෝ යන්ත්‍රය කුළියට දීම වෙනුවෙන් ලැබියයුතු රු.342,700 ක මුදලින් රු.52,800 ක් 2015 ජුනි 30 දින වන විට ද, අය වියයුතුව තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය.**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා.**

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අවුරුදු 05 කට වඩා පැරණි රු.473,092 ක් වටිනා ආදායම් ණයගැති ශේෂ 05 ක් හා වියදම් ණයහිමි ශේෂයක් පැවතුණ ද මෙම ශේෂ නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා.**

සභාව සතු වාහන නවතා තැබිම සඳහා ගරාජයක් සභාව සතුව නොතිබුණෙන් සභාවේ සිට කි.මි. 01 ක් පමණ දුරින් පිහිටි පෞද්ගලික ඉඩමක අව්වැසි වලට ලක් වෙමින් අනාරක්ෂිතව සභාවේ වාහන ගාල් කර තිබුණි.

**3.3 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්.**

---------------------------------------------

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 2002 මාර්තු 18 දින රු.85,001 කට මිල දී ගන්නා ලද කසළ කැබලි කිරීමේ යන්ත්‍ර නිෂ්ක්‍රීයව පවතින බව පසු ගිය විගණන වාර්තාව මගින් දිගින් දිගටම පෙන්වා දී ඇති නමුත්, මේ වන තෙක් එම යන්ත්‍රය සම්බන්ධ විධිමත් ක්‍රියාමාර්ගයන් ගෙන සුදුස්සක් කිරීමට කටයුතු කිරීමකින් තොරව ගබඩාවේ රදවාගෙන තිබුණි.

(ආ) රු.968,000 ක් වටිනා ට්‍රැක්ටරය හා ට්‍රේලර් 02 ක් වර්ෂ 05 කට වැඩි කාල සීමාවක සිට නිෂ්ක්‍රීයව හා ඌණ උපයෝජිතව පැවති බව නිරීක්ෂණය විය.

**3.4 කොන්ත්‍රාත් පරිපාලනය.**

---------------------------

**අංකුඹුර ගොඩමඩිත්ත - කිතුල්ගොල්ල මාර්ගය සංවර්ධනය කිරීම - වැය කළ මුදල රු.490,000**

---------------------------------------------------------------------------------------------

2015 පෙබරවාරි 16 දින කරන ලද භෞතික පරික්ෂාවේදි පහත කරුණු නිරීක්ෂණය විය.

I. 1:2:4 (3/4)" කොන්ක්‍රීට් මිශ්‍රණයේ 4" ඝනකමින් කොන්ක්‍රීට් කළයුතු මාර්ග තලය ස්ථාන කිහිපයකින් පළුදු කර පරීක්ෂා කිරීමේ දි, එහි ඝනකම 3.6" ක් බව නිරීක්ෂණය විය. ,එසේ ඉටු නොකළ වැඩ වෙනුවෙන් කියුබ් 0.897 ක් සඳහා රු.45,121 ක් වැඩිපුර ගෙවා තිබුණි.

II. කාර්මික නිලධාරීන්ගේ ප්‍රකාශවලට අනුව, යොදා තිබුණු කොන්ක්‍රීට් මිශ්‍රණය ඉතා දුර්වල මට්ටමක පැවතුණු අතර, සමස්තයක් ලෙස යථෝක්ත මාර්ගය ඇස්තමේන්තුගත ප්‍රමිතීන්ට හා ඉදි කිරීම් සම්මත පිරිවිතරයන්ට අනුකූලව ඉටු කර නොමැති බවක් නිරීක්ෂණය විය.

**4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය.**

---------------------------------------------

**4.1 ප්‍රසම්පාදන සැළැස්ම.**

--------------------------

රු.108,709,436 ක ප්‍රාග්ධන වියදම් සභාව දරා ඇති නමුත්, සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැළැස්මක් සකස් කර නොතිබුණි.

**4.2 අයවැය පාලනය.**

-------------------

සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙළ කර තිබුණු අයවැය ලේඛනයට අනුව, ඇස්තමේන්තුගත ආදායම් හා වියදම්, තථ්‍ය ආදායම් හා වියදම් සමග සැසඳීමේ දි ආදායම් විෂයයන් 04 ක සියයට 18 සිට සියයට 25 ක් දක්වා ද, වියදම් විෂයයන් 03 ක සියයට 64 සිට සියයට 100 ක් ඉක්මවා ද විචලනයක් නිරීක්ෂණය වු බැවින්, අයවැය ලේඛනය ඵලදායී පාලන කාරකයක් වශයෙන් යොදා ගෙන නොතිබු බව නිරීක්ෂණය විය.

**5. පද්ධති හා පාලනය.**

---------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) අයවැය පාලනය

(ඇ) ආදායම් පරිපාලනය

(ඈ) වත්කම් කළමනාකරණය

(ඉ) කොන්ත්‍රාත් පාලනය